# බලංගොඩ අධ්‍යාපන කළාපය

## නර්තනය - 7 ශ්‍රේණිය

## II වාරය

නිපුණතා මට්ටම :- 2.5.2- නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම :- වන්නම ගයමින් නටමු

තුරගා වන්නම :-

තිත : මාත්‍රා 2/3 දෙතිත සුළු මැදුම්

∧ /

තාල රූපය : 1 2 1 2 3

බෙර පදය : දොං ජිංත ගත දොංත

තානම: තත් තත් තනත් තත් තත් තනත් තනෙන

තත් තත් තනත් තම්ද තා නා

තන තනෙත තන තනෙන තතන තම් දෙන තනෙන

තානත් තනත් තම් ද නා නා

කවිය: සත් වෙත් මහත් අදර ලත් යුත් සිදත් කුමරු

ගත් සිත් තොසත් පැවිදි අංගා

අණ කරන ඡන්න යෙන කන්ථකය අසු ගෙනෙන

ගෙන යෙදුන අසුගෙ පිට නැංගා

ගත් ගත් පයත් අසුගේ ශබ්දත් වසත් සුරිඳු

යන්නෙන් තොසින් තිදෙන සමඟ

යන යනෙන කල තිදෙන එතැන තැන පසුව දැන

ගංතෙරට පත් උණිය එමඟා

ලත් ලත් සිතත් තිදෙන වෙත් වෙත් එකක් පසුව

මුත් කන්ථකත් වේ ය                                    තුරඟා

සිදුහතුන ගෙන වහන ඡන්න වලිගය අතින

පැන්නෙන් එතෙර අනොම                                    ගංගා

ගොත් සිත් මහත් රුසිරු ගත් යුත් සිදත් කුමරු

ගෙන් සෙත් රැගත් නෙර්ත                                    අංගා

තිදෙන පැන ගිය ගඟින එතෙද අණ ගෙන බැතින

යෙදුව නැණ වර්ණයෙන                                    තුරඟා

කස්තිරමඃ

කුඳ ගජිත කුඳ ගජිත කුඳ ගජිත කුඳ තා//

(දකුණ සහ වම)

කුඳ ගජිත කුඳ තා//

කුඳ තා//

කුඳ ගජිත කුඳ ගජිත කුඳ ගජිත කුඳ තා

https://youtu.be/MtBvoZ-eceI



පසු ක්‍රියාකාරකම: තුරඟා වන්නම තාල තබමින් කියන්න.

නියමිත අංගහාර අනුගමනය කරමින් හා වන්නම ගායනය කරමින් නර්තනය කරන්න

සැකසුම:- බී.එස් වීරසිංහ
ර/ උඩගම මහා විද්‍යාලය